# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

**2025 ජූලි**

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය**

**ක්‍රි.ව. 1453 සිට 1945 දක්වා නූතන යුරෝපයේ දේශපාලන ඉතිහාසය**

**HIST 38224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පුනරුදය සම්බන්ධයෙන් ඇති නිර්වචන සැකෙවින් දක්වා යුරෝපයේ පුනරුදය ඇති වූ ක්ෂේත්‍ර පිළිබඳ හැඳින්වීමක් කරන්න.

02. මාටින් ලූතර්ගේ දායකත්වය යටතේ යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ක්‍රියාත්මක වූ අයුරු පරීක්ෂා කරන්න.

03. 15 සහ 16 වන සියවස්වල යුරෝපයේ ජාතික රාජ්‍යය නැගී ඒමට තුඩුදුන් පසුබිම විග්‍රහකොට ජාතික රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

04. "ප්‍රංශ විප්ලවය නූතන යුරෝපය හැඩගැස්වීමෙහිලා බලපෑ තීරණාත්මක සන්ධිස්ථානයකි." විමසන්න.

05. "නැපෝලියන් බොනපාට්ගේ ආක්‍රමණශීලී හා ව්‍යාප්තවාදී ප්‍රතිපත්තිය ඔහුගේ බිඳ වැටීමට හේතු විය." සාකච්ඡා කරන්න.

06. ඉතාලිය එක්සත් කිරීමේ කාර්යයෙහිලා ජෝසප් මැසිනි, කවුන්ට් කැවූර් හා ගැරිබෝල්ඩි මෙන්ම වික්ටර් එම්මානුවෙල්ගේ දායකත්වය කෙබඳු දැයි පරීක්ෂා කරන්න.

07. එක්සත් ජර්මනියක් බිහිකිරීමෙහිලා බිස්මාක්ගේ දායකත්වය කෙරෙහි අවධානය යොමු කරමින් එහි ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.

08. යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් ආකාරය පරීක්ෂා කරන්න.

09. 1917 බොල්ෂෙවික් විප්ලවයට බලපෑ හේතු හා එහි ප්‍රතිඵල විමසන්න.

10. පළමුවන ලෝක යුද්ධයෙන් පසු ඉතාලිය තුළ ෆැසිස්ට්වාදය ව්‍යාප්ත වූ ආකාරය සාකච්ඡා කරන්න.

*****************************